## Quarterly Newsletter #9 – October 2024

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය අපගේ නව ප්‍රදර්ශනය වන ‘බිම් පෙරළිය’ පළමු වටමාරුව සැප්තැම්බර් 12 වන දින විවෘත කළේ ය. සන්දේව් හැන්ඩි සහ තිනාල් සජීව විසින් අභිරක්ෂණය කළ මෙම ප්‍රදර්ශනය මහජනතාවට නොමිලේ විවෘතයි. ‘බිම් පෙරළිය’ ප්‍රදර්ශනයේ පළමු වටමාරුව දෙසැම්බර් 1 වන දින අවසන් වීමට පෙර ක්‍රෙස්කැට් බූලේවාඩ්හි බිම් මහලේ පිහිටි කෞතුකාගාරයට පැමිණ නරඹන්න!

‘බිම් පෙරළිය’ ශ්‍රී ලංකාවේ ඉඩම් පරිවර්තනයවී ඇති පුළුල්, අනපේක්ෂිත, හා කැලඹිලිකාරී ආකාර ගවේෂණය කරයි. මෙම ප්‍රදර්ශනය භූ දර්ශනවල සාම්ප්‍රදායික නිදර්ශනවලට එහා ගිය නිර්මාණ කරන සමකාලීන කලාකරුවන් 29 දෙනෙකු එකට එක් කරයි. ඔවුන්ගේ කලාකෘති, ඉඩම් පිළිබඳ මත නොයෙක් අයුරින් ගොඩ නැගී ඇති අයුරුත් අභියෝගයට ලක්වී ඇති අයුරුත් පෙන්වා දෙයි. භූමියත් සමඟ ඇති අපගේ සබඳතා පිළිබඳ පරිපූර්ණ කතිකාවතක් අනාවරණය කරන සංදර්ශක පෙළක් ලෙස ‘බිම් පෙරළිය’ දිග හැරේ.

අපගේ ළාබාල ප්‍රේක්ෂකයින් වෙනුවෙන් ඔක්තෝම්බර් 5–6 දිනවල අප ළමා දින සති අන්තයක් පැවැත්වූවෙමු. 60කට අධික ළමුන් පිරිසක් අභිරක්ෂක සංචාර, වැඩමුළු, සහ ළමා ක්‍රියාකාරකම් සැසිවලට සහභාගී විය. මෙම සැමරුම් වඩාත් අලංකාරවත් කරමින්, ක්‍රෙස්කැට් බූලේවාඩ්හි ලොබියේ මුහුණු පින්තාරු, නේල් ආර්ට්, සහ බොම්බයි මොටයි කුටියක් ද තිබුණි.

MMCA ශ්‍රී ලංකාහි ජ්‍යෙෂ්ට අභිරක්ෂක සන්දේව් හැන්ඩි එක්සත් රාජධානියේ ‘Art Exchange: Moving Image’ සඳහා සහභාගී වීමට තේරුණු බව අප ඉතාමත් සතුටින් දැනුම් දෙමු. උප සහරානු අප්‍රිකාවේ සහ දකුණු ආසියාවේ මුල් සහ මධ්‍ය වෘත්තීය දෘශ්‍ය කලා අභිරක්ෂකවරුන් සඳහා සැලසුම් කළ මෙම වැඩසටහන, බ්‍රිතාන්‍ය කවුන්සිලයේ සහාය ඇතිව චාලක දෘශ්‍ය නිර්මාණ සහ Art South Asia Project (ASAP) සමග වැඩ කරන කලාකරුවන්ට සහාය ලබාදීම සහ, ඔවුන් ප්‍රවර්ධනය කිරීම සඳහා එක්සත් රාජධානියේ නියෝජිතායතනයක් වන LUX විසින් සංවිධානය කෙරේ.

මේ අතර, අපගේ පෙර ප්‍රදර්ශනය සඳහා විශේෂයෙන් පැවරූ කලාකෘතියක් වන ඉරුෂි තෙන්නකෝන්, සුමේධ කැලේගම, සහ සහ සුමුදු අතුකෝරාල යන සමකාලීන කලාකරුවන්ගේ ‘ ‘is this an architectural documentary?’ (2023) චිත්‍රපටය ලෝක ස්මාරක අරමුදල සමඟ එක්ව සැප්තැම්බර් 11 වන දින වික්ටෝරියා සහ ඇල්බර්ට් කෞතුකාගාරයේ දී තිරගත කරන ලදී. එම තිරගත කිරීමෙන් පසු, V&A හි චිත්‍ර, වාස්තු විද්‍යාව, ඡායාරූපකරණය සහ සැලසුම් නිර්මාණය පිළිබඳ භාරකරුවන ආචාර්ය ක්‍රිස්ටොපර් ටර්නර් සහ Counterspace හි නිර්මාතෘ සහ විදුහල්පති වන වාස්තු විද්‍යාඥ සුමය්යා වැලී අතර සම්මුඛ සාකච්ඡාවක් පැවැත්විණි.

සැප්තැම්බර් මාසයේ දී MMCA ශ්‍රී ලංකාහි ආදි කර්තෘ අනුග්‍රාහකයින් හොං කොන්ග්හි අභිරක්ෂණයකළ කලා සංචාරයකට එක් විය. මෙම චාරිකාව ආසියාවේ දෘශ්‍ය සංස්කෘතිය සඳහා වූ පළමු ගෝලීය කෞතුකාගාරයවන M+ හි අධ්‍යක්ෂක සුහන්යා රෆායල්ගේ විශේෂයෙන්

සංවිධානය කළ සංචාරයකින් ආරම්භ විය. ආදි කර්තෘ අනුග්‍රාහකයින් එහි නැවතී සිටි කාලය තුළ M+ Patrons, Asia Art Archive සහ Para Site විසින් ඔවුන්ට සත්කාරකත්වය සපයන ලදී. Tai Kwun Contemporary, Hauser & Wirth, David Zwirner සහ Center for Heritage, Art, and Textile and (CHAT) වැනි වෙනත් ආයතන විසින් ද ඔවුන් සාදරයෙන් පිළිගන්නා ලදී.

අපි Meatless Monday Sri Lanka සහ EthicalX සමඟ එක්ව නොවැම්බර් 2 වන දින මාංශ නිෂ්පාදන රහිත සල්පිලක් පැවැත්වූවෙමු. කොළඹ 3 ක්‍රෙස්කැට් බුලෙවාඩ් පරිශ්‍රයේ ලොබියේ පැවති මෙම වෙළඳ සල්පිලට පරිසර හිතකාමී දේශීය වෙළෙන්දන්ගේ පෙළගැස්මක් ඇතුළත් විය. මෙහිදී භූමිය සමඟ අපට ඇති සබඳතාව කේන්ද්‍රකරගත් ප්‍රජා සහභාගීත්වය පෝෂණය කිරීම සහ, අපගේ ජීවන රටාව හා සම්බන්ධ තේරීම් වඩාත් තිරසාර ලෙස නැවත සිතා බැලීමේ අවශ්‍යතාව පෙන්වීම සඳහා MMCA ශ්‍රී ලංකා කැපවන ආකාරය පිළිබිඹු කරන නිර්මාංශ නිෂ්පාදන ප්‍රචාරණය කෙරුණි.

## වේලාසනින් ආ නත්තල් තෑගි

මේ නත්තලේ ඔබේ ආදරණීයයන්ට සීමිත සංස්කරණ සරම් සහ සළු තිළිණකරන්න! Selyn සහ MMCA ශ්‍රී ලංකා විසින් නිර්මාණයකළ මෙම සුවිශේෂ අත්කම් රෙදිපිළි ජෝර්ජ් කීට්ගේ (1901–1993) සිතුවම් දෙකකින් ආභාෂය ලබා ඇත. ඔබට සහ ඔබේ ආදරණීයයන්ට, කලා ලෝලීන් ළඟ අනිවාර්යයෙන් ම තිබිය යුතු මෙම භාණ්ඩවලට වඩා හොඳ නත්තල් තෑගි තිබේ ද? මෙම සීමිත සංස්කරණ සළුව හෝ සරම ඇනවුම් කිරීමට MMCA ශ්‍රී ලංකා ඉන්ස්ටග්‍රෑම් පිටුව හෝ ෆේස්බුක් පිටුව හරහා අපට සෘජු පණිවිඩයක් එවන්න.

'දෙවැනි වෙළුම: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය' කෞතුකාගාරයෙන් හෝ අපගේ ඉන්ස්ටග්‍රෑම් සහ ෆේස්බුක් පිටු හරහා මිලදී ගත හැක. බැංගලෝරයේ වෙසෙන නියා තන්ඩපාණි විසින් නිර්මාණය කරන ලද, ශාර්මිණී පෙරේයිරා සහ කෞමදී ජයවීර විසින් සංස්කරණය කරන ලද මෙම ප්‍රකාශනය වාස්තු විද්‍යාවට ලැදියාවක් දක්වන කෙනෙකුට දිය හැකි කදිම තෑග්ගකි!

'දෙවැනි වෙළුම' නිෂ්පාදනය කිරීමේදී ඉතිරි වූ කඩදාසි කැබලිවලින් සාදන ලද සටහන් පොතක් හෝ පොත් මිටියක් ගන්න අමතක කරන්න එපා!

ප්‍රකාශනයේ දෙමළ සහ සිංහල අනුවාද අපගේ වෙබ් අඩවියෙන් නොමිලේ බාගත කළ හැක.